# සිහින දැකීම

සිහින මගින් අපේ ජීවිතයේ ඇතැම් විට අප සවිඥානික ව නොදන්නා බොහෝ දේ දැනගැනීමට හැකි බව අපේ රටවල විසුවන් දැන සිටියේ අද ඊයේ නො වෙයි. සිදුහත් කුමරු ඉපදීමට පෙර මහාමායා දේවිය දුටු සිහිනය ගැන මෙන් ම කොසොල් රජු දුටු සිහින ගැන ද අපි දනිමු. එමෙන් ම සිහින තේරුම් කිරීම සඳහා ද යම් පිරිසක් සිටි බව අපේ සාහිත්‍යයෙන් හෙළිවෙයි. සිහිනයක් දුටු විට ඒ වැදගත් යැයි සිතන්නේ නම් සිහින තේරුම්කරන්නකු මුණගැසී ඒ ගැන අවබෝධයක් ලබාගැනීමට ඇතැමුන් පෙළඹෙන්නට ඇති බව පැරණි සාහිත්‍යයෙන් අපට නිගමනය කළ හැකි ය.

අද බටහිර මනෝවිශ්ලේෂකයන් ද සිහින ගැන උනන්දුවක් දක්වනු පෙනෙයි. සිහින ඔස්සේ ඇතැම් ලෙඩ රෝග විනිශ්චය සඳහා ද ඔවුන් යොමු වී තිබෙනු දක්නට හැකි ය. සිහින දැකීම අපේ මනසේ ම කාර්යයක් බැවින් ඒ අපේ ජීවිතය සමග බැඳී ඇත. ඇතැම්විට අපේ ප්‍රශ්නවලට පිළිතුරු සිහින මගින් ලැබෙනවා විය හැකි ය. මේ පිළිබඳ ව හොඳ උදාහරණයක් වනුයේ අප කලින් ද සඳහන්කර ඇති කෙකුලේ නම් විද්‍යාඥයා දුටු සිහිනය ය. ඒ සිහිනය ඔස්සේ  ඔහු බෙන්සීන් අණුවේ ආකෘතිය නදර්මාණය කළ බව සඳහන් ය.

සිහින පිළිබඳ ගැටළු කිහිපයක් වෙයි. පළමුව සිහින දකින්නේ යටි සිත ය. ඒ සිහින උඩු සිතට යම් ආකාරයකින් සන්නිවේදනය වන්නේ නම් ඒ පිළිබඳ අපි සවිඥානික වෙමු. එමෙන් ම අපට මතක ඇත්තේ ද උඩු සිතට සන්නිවේදනය වන සිහින යැයි ගත හැකි ය. ඇතැම් සිහින දකින විට උඩු සිත ද යම් ආකාරයකට ක්‍රියාත්මක වනවා ද විය හැකි ය. ඒ සිහින පිළිබඳ ව ද අප සවිඥානික වන්නේ යැයි සිතිය හැකි ය.

දෙවනුව අප දකින සිහිනවලින් උඩු සිතට සන්නිවේදනය වන හෝ යම් ආකාරයකින් උඩු සිත ක්‍රියාත්මක ව ඇති විට දකින හෝ සිහින ප්‍රමාණය එතරම් විශාල සංඛ්‍යාවක් නොවනවා විය හැකි ය. මේ සිහින පිළිබඳ අප සවිඥානික වන නමුදු ඉන් අපට අවසානයේ දී මතක සිටින්නේ සුළු ප්‍රමාණයකි. එවිට අප දකින සිහිනවලින් විශාල ප්‍රමාණයක් පිළිබඳ ව අප අවිඥානික වන බවත් සවිඥානික වන සිහිනවලින් ද මතක සිටින්නේ සුළු ප්‍රමාණයක් බවත් පැහැදිලි ය. එසේ නම් අපට මතක නැති හා අප අවිඥානික වන සිහින පිළිබඳ අපට කිව හැක්කේ කුමක් ද?

තුන්වනුව සිහින දැකීමේ දී ප්‍රධාන වන්නේ යටි සිත බැවින් එහි සංකේත හා න්‍යාය අපට නො තේරෙයි. අපේ සංකේත, න්‍යාය හා ඒ ආශ්‍රිත තර්කනය උඩු සිත සමග බැඳී ඇත. උඩු සිත මනසින් බාහිර අනෙක් ඉන්ද්‍රිය සමග ද බැඳුණේ වෙයි. එබැවින් එහි න්‍යාය හා තර්කනය එයට ගැලපෙන අයුරින් සකස් වී ඇත. උඩු සිතෙන් අපට උස පොල්ගසක් උඩින් පැනීමට නොහැකි බව කියැවෙයි. ඒ අපේ සිරුර එපමණක උසකට ගෙන යැමට නොහැකි බව අපේ ඉන්ද්‍රිය ගෝචර අත්දැකීම වන බැවින් ය.  එහෙත් යටි සිතට එවැනි බාධාවක් නැත. එබැවින් යටි සිත උස පොල්ගසක් උඩින් පැනීම, අහසේ පියැඹීම ආදිය ගැන ද සිතයි.

ප්‍රශ්නය වනුයේ යටි සිත එලෙස දකින්නේ කුමක් ද යන්න ය. උස පොල් ගසක් උඩින් පැනීම යනු පොල් ගසක් උඩින් පැනීමක් නොවිය හැකි ය. යටි සිත යොදාගන්නා සංකේත න්‍යාය ගැන අප නොදන්නා බැවින් උස පොල් ගසක් උඩින් පැනීමෙන් අදහස් වන්නේ කුමක් දැයි අපි නො දනිමු. එවැනි සිහින අපට තේරෙන සංකේතවලින් හා න්‍යායෙන් අර්ථකථනය කිරීම ඒ පිළිබඳ ව හැදෑරූ අයගේ කාර්යයක් වෙයි. පැරණි භාරතයේ හා ලංකාවේ ද එලෙස සිහින අර්ථකථනය කිරීමට හැකි අය සිටි බව පැහැදිලි ය.

සිහින අර්ථකථනය කිරීම සුළුපටු කාර්යයක් හෝ ඒ පිළිබඳ දැනුමක් නැත්තවුන්ට කළහැකි කාර්යයක් හෝ නො වෙයි. එහෙත් අද ඇතැම් නවකතාකරුවන් එවැනි ව්‍යායාමයක යෙදෙන බවත් ඔවුන්ගේ නවකතා විවේචනය කරන්නවුන් ද ඒ පිළිබඳ විවිධ අර්කථන කරන බවත් පැහැදිලි ය. බටහිර මහත් ගෞරවයට පාත්‍ර වූ කෆ්කා නම් නවකතාකරුවා මේ සම්බන්ධයෙන් බොහෝවිට අනුගමනය කෙරෙන තැනැත්තා වෙයි. මෙරට ද අනුකාරකයෝ ඔහු අනුව නවකතාකරණයෙහි යෙදෙන බව පෙනෙන්ට ඇත. මේ පුහු අනුකාරකයන් ගැන කතාකිරීම ඵලදායී ක්‍රියාවක් නො වෙයි. එමෙන් ම ඔවුන්ට හෝ ඔවුන්ගේ විචාරකයන්ට හෝ වැදගත් තැනක් දීම ද අනවශ්‍ය වෙයි. අපි ඒ වෙනුවට

© Prof. Nalin De Silva

සිහිනය හා සාමාන්‍යයෙන් සිහිනය නොවන්න යැයි කියැවෙන්න අතර වෙනස තවදුරටත් සාකච්ඡා කරමු. එමගින් සිහින නවකතාවල ඇතුළත් විය හැකි ආකාරය ගැන ද සිතා බලමු.

සිංහල බෞද්ධයන්ට නම් සාමාන්‍ය ව්‍යවහාරයේ දී සිහින යැයි හැඳින්වෙන දෑ ද සිහිනවලින් වෙනස් නො වෙයි. ඊනියා යථාර්ථය යැයි කියැවෙන්න ද මනසේ නිර්මාණයක් වන බැවින් සිහින එවැනි යථාර්ථයකින් වෙන්කර ගැනීමට නො හැකි ය. සිහින යන සංකල්පය ද මනසේ නිර්මාණයක් වෙයි. අප සිහින යනුවෙන් හඳුන්වන්නේ නින්දේ දී අපේ මනසින් අත්විඳින, අපට ඒ පිළිබඳ සවිඥානික වු ද යම් ක්‍රියාවලියකට ය. ඉන් යම් ප්‍රමාණයක් පිළිබඳ ව අපට මතකයක් වෙයි. අපි ඇතැම් විට සිහිනයක් දුටු බවත් එහෙත් ඒ ගැන මතකයක් නැති බවත් කියමු.

උඩු සිතෙන් අප නිර්මාණයකරන දෑ ද නිර්මාණ මිස යථාර්ථයක් නො වෙයි. පුටුව මේසය පෑන මම ආදී සංකල්ප අපේ නිර්මාණ වෙයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධය හේතුකොටගෙන අපි ඒ සංකල්ප නිර්මාණය කරන්නෙමු. මේසය යනුවෙන් සංකල්පයක් නිර්මාණය කරගත් පසුව සමාජයේ බොහෝ දෙනකු ඒ පිළිබඳ එකඟතාවයකට පත් වූ පසු අපට ඒ සංකල්පය බොහෝ අවස්ථාවල සංගත ව යොදාගත හැකි ය. පුටුව යන සංකල්පය ද එසේ ය. එහෙත් ඇතැම් අවස්ථාවක පුටුව ආසනය වැනි සංකල්ප සම්බන්ධයෙන් ද අපට ප්‍රශ්න ඇතිවෙයි.

බසයක ඇති ආසනවලට අපි පුටු යැයි නො කියමු. එහෙත් කුඩා දරුවකු බසයේ ඇති ආසනවලට ද පුටු යැයි කීමට ඉඩ ඇත. ඒ දරුවාට ආසනය යන සංකල්පය නොමැති නම් හා ඔහු දැක ඇති ආසන සියල්ල පුටු නම් ඔහු බසයේ ආසනවලට ද පුටු යැයි කීමට ඉඩ ඇත. අනෙක් අතට ඇතැම් නිවෙස්වල ඇති උඩැක්කි වැනි ආසන ඒ ආසන නුහුරු අයට ආසන නොවනු ඇත. එලෙස ඒ ආසන නුහුරු අයකුට ඒ ආසන ලෙස හඳුනාගැනීමට සමාජය විසින් උදව්කෙරෙයි. එයට බලපෑමක් යැයි කීව ද වරදක් නැත.

කෙසේ හෝ උඩු සිතට ගෝචර ඓන්ද්‍රීය අත්දැකීම් පිළිබඳ ව අප සියළු දෙනා යම් යම් සම්මුතීන්ට එළඹ ඇත. මේ සම්මුතීන් හේතුවෙන් ඒ යථාර්ථයක් ලෙස සැලකීමට ද ඇතැමුන් පෙළඹී ඇත. අප සියළු දෙනාට ම බොහෝ විට එක හා සමාන ඉන්ද්‍රිය තිබීම ද එලෙස සම්මුතීන් වලට එළඹීමටත් ඒ සම්මුතීන් යථාර්ථය ලෙස ගැනීමටත් හේතු වී ඇත. ඒ සම්මුති ලෝකයෙහි න්‍යාය ඇරිස්ටෝටලීය න්‍යාය, චතුස්කෝටික න්‍යාය ආදිය විය හැකි ය. බටහිරයන්ට නම් ඇත්තේ ද්විකෝටික ඇරිස්ටෝටලීය න්‍යාය පමණකි.

එලෙස සම්මුතියක් ලෙස ගැනීම නිසාම ඉන්ද්‍රිය ගෝචර ලෝකය වුව ද විවිධ අර්ථකථනයන්ට භාජනය වෙයි. පොදු සම්මුතියකට ගෙන ඒමට කෙතරම් උත්සාහ කළ ද පුද්ගලයන්ගේ මනස් වෙනස් වෙයි. එකිනෙකාගේ අත්දැකීම්, සාංසාරික පුරුදු, සංස්කෘතීන් වෙනස් බැවින් විවිධ අර්ථකථන බලාපොරොත්තු විය යුතු ම ය. මෙය මෙසේ නොවේ යැයි කිසිම යථාර්ථවාදියකුට හෝ භෞතිකවාදියකුට හෝ කිව නො හැකි ය. නවකතාවක් පමණක් නොව දර්ශනය හා සම්බන්ධ පොතක් වුව ද කියවන්නන් දෙදෙනකු ඉන් එකම තේරුමක් නො ගනියි. ඔවුන්ගේ අවබෝධය සාපේක්ෂ වෙයි. ඒ සාපේක්ෂතාව සංස්කෘතීන්, මනස් හා ඇතැම්විට ඉන්ද්‍රිය වෙනස් වන බැවින් ය. මේ පිළිබඳ විස්තර මගේ ලෝකය කෘතියෙහි වෙයි.

කෘතියක් යනුවෙන් යමක් නැතැයි කීමට බටහිර පශ්චාත්නූතනවාදීන් යැයි කියාගන්නවුන් පෙළඹී ඇත්තේ මේ නිසා ය. ඇත්තේ එකිනෙකාගේ කියවීම් යැයි ඔවුහු කියති. බොහෝ දෙනා අද පණ්ඩිතමානීව කියැවීම් ගැන කතාකරති. මේ ඊනියා කියවීම් යනු අන් කිසිවක් නොව ඒ ඒ අයට සාපේක්ෂව කෘතියක් පෙනෙන අයුරු ය. මෙහි දී කෘතිය යනුවෙන් අදහස් කෙරෙන්නේ කතුවරයාට සාපේක්ෂව ලියැ වී ඇති දේ ය. කතුවරයා යම්කිසිවක් ලියයි. ඒ යථාර්ථයක් නො වෙයි. කතුවරයා ලියා ඇති දේ එකිනෙකාට ගොචර වන්නේ එක් එක් ආකාරයකට ය. ඒ ගෝචර වීම සාපේක්ෂ ය. යමක් නිර්මාණය කරන්නේ කතුවරයා පමණක් නො වෙයි. පාඨකයා ද කියවන්නේ තමාගේ ම වූ නිර්මාණයක් කරගනිමින් ය. එක් එක් අයට සාපේක්ෂ වූ කියවීම් ඒ ඒ අයගේ නිර්මාණ වෙයි. කතුවරයා නො සිතූ දෑ බොහෝ පාඨකයෝ නිර්මාණය කරති. එහි වරදක් නැත. ඉන් පෙනී යන්නේ සාපේක්ෂතාව හා නිර්මාණය ය.

© Prof. Nalin De Silva

උඩු සිත පිළිබඳ ව ද එලෙස නම්, විවිධ පුද්ගලයන් එලෙස විවිධ අර්ථකථන කරන්නේ නම් අනෙක් ඉන්ද්‍රිය සමග බැඳී නැති යටි සිත ගැන කියනුම කවරේ ද? යටි සිත මුල් වී දකින සිහින ගැන අර්ථකථන කරන්නේ කෙසේ ද? එහි ද විවිධ අර්ථකථන තිබිය හැකි බව පැහැදිලි ය. ඒ අර්ථකථනවලින් අප කුමක් තෝරාගන්නේ ද? අප සිතනවාට වඩා මේ ප්‍රශ්නය සංකීර්ණ ය. එහෙත් බොහෝ දෙනා කෆ්කා නම් කතාකරුවා අනුකරණයකරන්නන්ගේ කෘතිවලට නිරපේක්ෂ අර්ථකථන දීමට වලිකෑම සිනහ උපදවන්නක් වෙයි.

යටි සිතෙහි සිදුවන ක්‍රියාකාරකම් පිළිබඳ ව ප්‍රමාණවත් ප්‍රවාද ගොඩනගා නැති බටහිර ලෝකයෙහි නවකතාකරුවන්ට තම නිර්මාණ ලෙස යටි සිතෙහි  ඇතිවන සිතිවිලි ගැන හෝ සිහින ගැන හෝ ලිවීමට බාධාවක් නැත. එහෙත් බටහිර කතාකරුවන් ඒ ගැන ලියන දේ ඊනියා යථාර්ථයක් ලෙස ඉදිරිපත්කිරීමට වෑයම්කිරීම නම් බංකොලොත් ක්‍රියාවකි. අප රටෙහි අනුකාරකයන් නොදන්නා කරුණක් නම්  බටහිර ඊනියා ම2නෝවිශ්ලේෂන ප්‍රවාද ඉතාමත් නොදියුණු තතීවයක ඇති බව ය. බටහිර භෞතික වියාව හා සමග සන්සන්දනය කළහොත් බටහිර මනෝවිශ්ලේෂණ ප්‍රවාද පවතින්නේ පූර්ව ගැලීලීය මට්ටමක යැයි කිවහැකි ය. එවැනි ප්‍රවාද මහත් ගෞරවයෙන් පිළිගන්නවා වෙනුවට අපට අපේ සම්ප්‍රදායෙහි ඇති දැනුම උපයෝගී කරගැනීමට   හැකි ය.  යථාර්ථයක් නොමැති සිංහල බෞද්ධයනට වෙනත් බොහෝ දෙනකුට වඩා යටි සිත සමීප වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva